# ශ්‍රී ලංකාවේ එකම ස්වාභාවික ලෝක උරුමය

# "සිංහරාජ වැසි වනාන්තරය"

**"වනාන්තරය යනු මානව වර්ගයාගේ ප්‍රධානතම ජීව ප්‍රභවය" යැයි ලෝක ප්‍රකට පරිසරවේදියකු වන, තෝමන් මයර්ස් ප්‍රකාශකර තිබේ. මිනිසා ප්‍රමුඛ විවිධ ජාතීන්ගේ පැවැත්ම උදෙසා වනාන්තර මගින් විවිධාකාරයෙන් ඉටුකරනු ලබන සේවය අදෘශ්‍යමාන වුවද, ඒ නිසාම වනාන්තරවල අගය පිළිබඳව අවතක්සේරුවක් කළ නොහැක.**







**ඉතා අධික ජෛව විවිධත්වයක් සහිත සිංහරාජ වනාන්තරය තුළ පවතින ශාක වල හා ජීවත්වන සතුන්ගේ විවිධත්වය හා වටිනාකම නිසාම එය ලෝක උරුම වනභූමියක් ලෙස 1989 වර්ෂයේ දී යුනෙස්කෝ සංවිධානය විසින් නම්කර තිබේ.**

**යූ.පී.එස්. පතිරණ**

වනාන්තර මගින් පෝෂිත ජෛව විවිධත්වය තුළින් මානව වර්ගයාගේ පැවැත්මට මහගු පිටුවහලක් ලබාදෙයි. විශේෂයෙන් මිනිස් වර්ගයා පෙළෙන රෝග පීඩා රැසකටම සාර්ථක ප්‍රතිකාර ලබාදිය හැකි ඖෂධ පැළෑටි බොහොමයකට නිජබිම වී ඇත්තේ ලොවෙහි පැතිර පවත්නා වැසි වනාන්තර බව පිළිගැනේ. ඔස්ට්‍රේලියාවේ පැනමාවේ හා කොස්ටරිකාවේ පිහිටි එබඳු වැසි වනාන්තර ගැන කථාකරන විට අනිවාර්යයෙන්ම සඳහන් කළයුතු ඊළග වැසි වනාන්තරය වනුයේ ශ්‍රී ලංකාවේ සිංහරාජ වැසි වනාන්තර වේය.

ශ්‍රී ලංකාවේ සුවිශේෂී ලෝක උරුම ස්ථාන 7 අතුරෙන් එකම ස්වභාවික ලෝක උරුම ස්ථානය වන, සිංහරාජ වැසි වනාන්තරය. ශ්‍රී ලංකාවේ තෙත් කලාපයට අයත් සදාහරිත වනාන්තරයක් වන අතරම, එය රත්නපුර, ගාල්ල මාතර යන දිස්ත්‍රික්ක තුනටම අයත් හෙක්ටයාර් 11187 ක් පමණ වූ භූමි ප්‍රමාණයක් පුරා විහිදී පවතී. රක්වාන කඳු වළල්ලට අයත්, සිංහරාජ වැසි වනාන්තරයට දිගින් කි.මී.21 කින්ද අවම පළල කි.මී.3 කින්ද සමන්විත වන අතර, උපරිම උසද මීටර් 1171 ක් හා අවම උස මීටර් 90 ක් ද වේ.

සිංහරාජ වනාන්තරයට එම නම සැදුනේ ඈත අතීතයේ දී එම වනාන්තරයේ බලය පතුරුවා සිටි දැවැන්ත සිංහයෙකු නිසා යැයි ජනප්‍රවාදයේ දැක්වේ. පුරා විද්‍යා ගවේෂණවලට අනුකූලව මීට වර්ෂ 13,000 - 12,300 ත් අතර කාලය තුළ මෙරට සිංහයින් විසූ බව නිගමනය කර ඇති හෙයින්, සිංහරාජ වනාන්තරය හා සිංහයෙකු සමග සම්බන්ධ කිරීමේ වරදක් නොමැති බව පෙනේ. ශ්‍රී ලංකාවේ ප්‍රථමවරට රත්නපුර මාර්ගයේ කුරුවිට, පත්විල, ඒදණ්ඩාවෙල ප්‍රදේශයේ මැණික් පතලකින් හමුවූ සිංහ පොසිලයන් 1947 දී කුරුවිට ගෝණපිටියේ අඩි 20 ක ගැඹුරු පතලකින් හමුවූ සිංහයකුගේ පහළ හකුවේ දකුණු රදනක දත් කැබල්ලත්, කුරුවිට බටදෙඹ ලෙනේ හතරවන කැනීම් ස්ථානයේ දී හමුවූ සිංහයකුගේ ඇටකැබලි හා දත් කැබලි ද අප රටේ සිංහයන් විසූ බවට පෙන්වා දේ.ඊසානදිග නිරිතදිග යන මෝසම් දෙකෙන්ම වර්ෂාව ලබන සිංහරාජයේ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 3000 -6000 ත් අතර වේ.

මේ නිසාම සිංහරාජ වානාන්තරය ශ්‍රී ලංකාවේ ඇති ප්‍රධානතම ජල සංචිතයක් ලෙස සැලකේ. සිංහරාජයේ දිය උල්පත් වලින්, විශේෂයෙන් කළු ගඟ හා ගිං ගඟ පෝෂණය වී තිබේ.

ඉතා අධික ජෛව විවිධත්වයක් සහිත සිංහරාජ වනාන්තරය තුළ පවතින ශාක වල හා ජීවත්වන සතුන්ගේ විවිධත්වය හා වටිනාකම නිසාම එය ලෝක උරුම වනභූමියක් ලෙස 1989 වර්ෂයේ දී යුනෙස්කෝ සංවිධානය විසින් නම්කර තිබේ.